**OL/2009/11-S-I**

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
*All Rights Reserved*]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**11 S I**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2009 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2009 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2009**

| | |
|---|---|
| බුද්ධ ධර්මය I<br>பௌத்தம் I<br>**Buddhism I** | පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>*Three hours* |

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.
(v) I හා II පිළිතුරු පත්‍ර එක් පිළිතුරු පත්‍රයක් වන සේ එකට අමුණා භාර දෙන්න.
(vi) **ප්‍රශ්න පත්‍ර දෙකට ම කාලය පැය තුනකි.**

---

1. සිදුහත් බෝසතාණෝ බුද්ධත්වයට පත්වීමෙන් පසු උන්වහන්සේට පළමු දනය පිළිගන්වනු ලැබුවේ,
   (1) සුජාතා සිටු දේවිය විසිනි.
   (2) තපස්සු භල්ලුක වෙළෙඳුන් විසිනි.
   (3) චුන්ද කර්මාර පුත්‍රයා විසිනි.
   (4) බිම්බිසාර රජතුමා විසිනි.

2. "මිනිස් පරපුර නමැති වෘක්ෂයෙහි අපමණ කලෙකට පසුව පිපෙන, පිපුණාට පසුව ප්‍රඥා සුගන්ධයෙන් සහ කරුණා මකරන්දයෙන් ලෝකය පුරවන අසාමාන්‍ය පුෂ්පය බුදුරජාණන් වහන්සේ ය." මෙලෙස ප්‍රකාශ කළේ,
   (1) සර් එඩ්වින් ආර්නෝල්ඩ් ය.
   (2) රීස් ඩේවිඩ්ස් ය.
   (3) ජවහර්ලාල් නේරු ය.
   (4) එච්.ජී. වෙල්ස් ය.

3. අප මහා බෝසතාණන් වහන්සේ වීර්ය පාරමිතාව සම්පූර්ණ කළ ආකාරය පැහැදිලි වන ජාතක කථාවකි,
   (1) මඛාදේව ජාතකය.
   (2) උම්මග්ග ජාතකය.
   (3) වණ්ණුපථ ජාතකය.
   (4) තේමිය ජාතකය.

4. "දෙහොත් මුදුන් තබා නමස්කාර කිරීමට සුදුසු" යන සඟ ගුණය ප්‍රකාශ වන පාලි පාඨය වන්නේ,
   (1) ආහුණෙය්‍ය යන්නයි.
   (2) පාහුණෙය්‍ය යන්නයි.
   (3) දක්ඛිණෙය්‍ය යන්නයි.
   (4) අඤ්ජලිකරණීය යන්නයි.

5. මෛත්‍රී භාවනාව වැඩීම ආරම්භ කරන පුද්ගලයා තුළ පැවතිය යුතුයැ'යි කරණීය මෙත්ත සූත්‍රයේ දක්වෙන ගුණාංග අතර 'ආඩම්බරයෙන් තොරවීම' හැඳින්වෙන්නේ,
   (1) සුවචො නමිනි.   (2) සුභරො නමිනි.   (3) නිපකො නමිනි.   (4) අනතිමානී නමිනි.

6. ඊළඟ භවයෙහි ඒකාන්ත වශයෙන් විපාක දෙන කර්මය,
   (1) ගරුක කර්ම නම් වේ.
   (2) ආසන්න කර්ම නම් වේ.
   (3) ආචිණ්ණ කර්ම නම් වේ.
   (4) කටත්තා කර්ම නම් වේ.

7. සාංසාරික ජීවිතයේ කවර හෝ අවස්ථාවක විපාක ලැබෙන කර්ම,
   (1) දිට්ඨධම්මවේදනීය කර්ම නමින් හැඳින්වේ.
   (2) උපපජ්ජවේදනීය කර්ම නමින් හැඳින්වේ.
   (3) අපරාපරියවේදනීය කර්ම නමින් හැඳින්වේ.
   (4) අහෝසි කර්ම නමින් හැඳින්වේ.

[ දෙවැනි පිටුව බලන්න.

8. "යාදිසං වපතෙ බීජං - තාදිසං හරතෙ ඵලං" " වපුරන ලද බීජවලට අනුරූපි ව අස්වැන්න ලබයි." යන මෙම දේශනා පාඨය ඇසුරෙන් අපගේ ජීවිත සකස්කර ගැනීමට ලැබෙන උපදේශය වන්නේ,
   (1) කෘෂිකාර්මික ජීවන ක්‍රමය වඩාත් උචිත බවයි.
   (2) කරනු ලබන කර්මයේ ස්වරූපය අනුව විපාක ලබන බවයි.
   (3) බීජ ශක්තිය ඇති බීජවලින් ම සරු අස්වැන්න ලබන බවයි.
   (4) ජීවිතයේ උස්මිටිකම්වලට ඔරොත්තු දිය යුතු බවයි.

9. සමස්ත ලෝකයෙහි සිදු වන ඍතු විපර්යාස ආදිය ඇතුළු කායික මානසික ක්‍රියාවලි විග්‍රහ වන ධර්ම පර්යායය,
   (1) පංචස්කන්ධ විවරණය නමින් හැඳින්වේ.
   (2) පංචනීවරණ ධර්ම විවරණය නමින් හැඳින්වේ.
   (3) පංචනියාම ධර්ම විවරණය නමින් හැඳින්වේ.
   (4) පංචබලි සංකල්පය නමින් හැඳින්වේ.

10. අපගේ කායික වාචසික හා මානසික හැසිරීම, අයහපතෙන් බැහැර කොට යහපතෙහි යෙදවීම සඳහා උපදෙස් සපයන ධම්මපද ගාථාවේ මුල් **දෙපදය** වන්නේ,
   (1) "සබ්බපාපස්ස අකරණං - කුසලස්ස උපසම්පදා" යන්නයි.
   (2) "අත්තනාව කතං පාපං - අත්තනා සංකිලිස්සති" යන්නයි.
   (3) "සබ්බෙ තසන්ති දණ්ඩස්ස - සබ්බෙ භායන්ති මච්චුනො" යන්නයි.
   (4) "අසාරෙ සාරමතිනො - සාරෙචාසාර දස්සිනො" යන්නයි.

11. යුග ජීවිතය ආරම්භ කළ තරුණ යුවළ සෑම වර්ෂයකම තම නිවසේ දානමය පුණ්‍යකර්මයක් සිදු කොට රත්නත්‍රයේ ආශිර්වාදය ලබා ගැනීම පුරුද්දක් කොට ගත් හ. පාසල් ජීවිතයේ දී ඔවුන් ලත් ධර්මාවබෝධය මේ සඳහා ඉවහල් විණි. ඔවුන් මෙලෙස පින් දහම් කිරීමට යොමු වූයේ තෙරුවන් කෙරෙහි ඔවුන් තුළ ඇති වූ,
   (1) භක්තිය නිසා ය.
   (2) විශ්වාසය නිසා ය.
   (3) අනුකරණය නිසා ය.
   (4) ශ්‍රද්ධාව නිසා ය.

12. සිත සංවර කරලීමට බාධාකරන කරුණු පංචනීවරණ ලෙස හඳුන්වන අතර බුද්ධාදී අටතැන්හි සිතේ ඇති වන සැකය හෙවත් වැනෙනසුළු ගතිය,
   (1) ව්‍යාපාද නමින් හැඳින්වේ.
   (2) ථීනමිද්ධ නමින් හැඳින්වේ.
   (3) උද්ධච්ච - කුක්කුච්ච නමින් හැඳින්වේ.
   (4) විචිකිච්ඡා නමින් හැඳින්වේ.

13. විවිධ අරමුණු කරා ගමන් කරන, නිතර වෙනස් වන, චංචල සිත සමාධිගත කරගැනීමට **පමණක්** ඉවහල් වන භාවනා ක්‍රමය,
   (1) සමථ නමින් හැඳින්වේ.
   (2) විදර්ශනා නමින් හැඳින්වේ.
   (3) ව්‍යතික්‍රම නමින් හැඳින්වේ.
   (4) අප්‍රාණක ධ්‍යාන නමින් හැඳින්වේ.

14. තරුණ සමිතියේ සභාපතිතුමා කථාව කරමින් ප්‍රකාශ කළේ, දුම්වැටි උරන සමාජයක දුම් නොබී සිටීමට, මත්වතුර බොන සමාජයක අමද්‍යපව සිටීමට, තමන්ට නිවැරදි මග පෙන්වීම ලැබුණේ තමා උගත්,
   (1) පද්මාකාර ජීවිතය පිළිබඳ පාඩමෙන් බවයි.
   (2) පරෝපකාරය පිළිබඳ පාඩමෙන් බවයි.
   (3) සමාජ සේවය පිළිබඳ පාඩමෙන් බවයි.
   (4) රාජ්‍ය පාලනය පිළිබඳ පාඩමෙන් බවයි.

15. "සමාජයේ සෙසු පුද්ගලයන් අකුසල ධර්මයන්ගෙන් අපිරිසිදුව සිටිය ද අපි ඒවායින් වැළකී පිරිසිදු සිතින් වාසය කළ යුත්තෙමු'යි" යන ප්‍රතිපත්තිය,
   (1) මධ්‍යම ප්‍රතිපදාව නම් වේ.
   (2) සල්ලේඛ ප්‍රතිපදාව නම් වේ.
   (3) අත්තුපනායික ප්‍රතිපදාව නම් වේ.
   (4) කුසලාකුසල ප්‍රතිපදාව නම් වේ.

16. බුදුරජාණන් වහන්සේගේ දේශනාව අනුව දිවා රාත්‍රී පින් වැඩෙන කුසල ක්‍රියා ගණයට අයත් **නො වන්නේ**,
   (1) මල් පලතුරු උයන් වගා කිරීමයි.
   (2) ස්වාභාවික වනාන්තර ආරක්ෂා කිරීමයි.
   (3) ඒදඬු පාලම් පැන්හල් පොකුණු තැනීමයි.
   (4) තෝරාගත් වෘක්ෂ වන්දනා කිරීමයි.

17. මානසික වශයෙන් නීරෝගීවීම සඳහා ඉවහල් වන කායානුපස්සනා, වේදනානුපස්සනා, චිත්තානුපස්සනා, ධම්මානුපස්සනා යන සතර,
   (1) අසුභ භාවනා නමින් හැඳින්වේ.
   (2) චතුරාරක්ඛා භාවනා නමින් හැඳින්වේ.
   (3) සතිපට්ඨාන භාවනා නමින් හැඳින්වේ.
   (4) කර්මස්ථාන භාවනා නමින් හැඳින්වේ.

18. සිගාලෝවාද සූත්‍රයේ දී පුද්ගලයා ඉපයූ ධනය විනාශ වන දොරටු හයක් දේශනා කළ අතර ඊට අයත් **නො වන** කරුණ වන්නේ,
   (1) මත්පැන් පානයයි.
   (2) නොකල්හි වීදි සංචාරයයි.
   (3) සූදුවට ලොල්වීමයි.
   (4) අනලස් බවයි.

[ තුන්වැනි පිටුව බලන්න.

19. "බමුණ, ඔබ නිවසට පැමිණෙන ආගන්තුකයන් සඳහා පිළියෙල කරන ලද සංග්‍රහයක් ඔවුන් නොපිළිගන්නේ නම් එය ඔබට ම වන්නා සේ මා ඔබගේ පරිභවය නොපිළිගන්නා බැවින් එය නැවතත් ඔබට ම වන්නේය"යි" බුදුරදුන් වදළේ,
    - (1) අග්ගික භාරද්වාජ බමුණාට ය.
    - (2) අක්කෝසක භාරද්වාජ බමුණාට ය.
    - (3) කසී භාරද්වාජ බමුණාට ය.
    - (4) සෝණදණ්ඩ බමුණාට ය.

20. බුදු දහමට අනුව සත්ත්වයා සංසාරයේ ඉපිද, ජීවත් ව, මරණයට පත් වී නැවත නැවතත් ඉපදීම පුනර්භවය ලෙස හඳුන්වනු ලැබේ. මෙසේ සත්ත්වයින් සසර මැරෙන උපදින අයුරු දක්නා නුවණ,
    - (1) පුබ්බෙනිවාසානුස්සති ඥාන නමින් හැඳින්වේ.
    - (2) චුතූපපාත ඥාන නමින් හැඳින්වේ.
    - (3) දිබ්බචක්ඛු ඥාන නමින් හැඳින්වේ.
    - (4) ආසවක්ඛය ඥාන නමින් හැඳින්වේ.

21. පටිච්චසමුප්පාදය හෙවත් හේතුඵල දහම අනුලෝම වශයෙන් දක්වන තන්හි "කුසලාකුසල රැස්කිරීම හෙවත් සංස්කාර ඇති කල්හි විඤ්ඤාණය ඇති වේ." යන්නෙහි දේශනා පාඨය,
    - (1) 'අවිජ්ජා පච්චයා සංඛාරා' නම් වේ.
    - (2) 'සංඛාර පච්චයා විඤ්ඤාණං' නම් වේ.
    - (3) 'විඤ්ඤාණ පච්චයා නාමරූපං' නම් වේ.
    - (4) 'තණ්හා පච්චයා උපාදානං' නම් වේ.

22. සදිසා නමස්කාරයෙහි උඩ දිශාව නියෝජනය කරන පැවිදි උතුමන්ගෙන් ගිහි ජනයාට ඉටුවිය යුතු යුතුකම් අතරට අයත් **නො වන** කරුණ වන්නේ,
    - (1) පවින් වැළැක්වීමයි.
    - (2) යහපතෙහි යෙදවීමයි.
    - (3) සුගති මාර්ගය කියාදීමයි.
    - (4) ආමිසයෙන් සංග්‍රහ කිරීමයි.

23. වෙළඳාම තම ජීවිකා වෘත්තිය ලෙස තෝරාගත් අයෙක් පස්වැදෑරුම් වැරදි වෙළඳාම්වලින් වැළැකී සිටීමට ඉටා ගත්තෝ ය. එය අරිඅටගි මගෙහි,
    - (1) සම්මා ආජීව මාර්ග අංගයට අයත් වේ.
    - (2) සම්මා කම්මන්ත මාර්ග අංගයට අයත් වේ.
    - (3) සම්මා වායාම මාර්ග අංගයට අයත් වේ.
    - (4) සම්මා සමාධි මාර්ග අංගයට අයත් වේ.

24. මෛත්‍රී වැඩීමෙන් ලැබෙන ආනිසංස ගණයට ඇතුළත් **නො වන** කරුණ වන්නේ,
    - (1) මිනිසුන්ට ප්‍රියවීමයි.
    - (2) මුහුණ පැහැපත්වීමයි.
    - (3) නපුරු සිහින නොදැකීමයි.
    - (4) සිහිමුලාව කලුරිය කිරීමයි.

25. පංචස්කන්ධය, අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් ප්‍රඥාවෙන් දකිමින් කරනු ලබන භාවනාව හඳුන්වනු ලබන්නේ,
    - (1) ස්කන්ධ භාවනාව නමිනි.
    - (2) සමථ භාවනාව නමිනි.
    - (3) විදර්ශනා භාවනාව නමිනි.
    - (4) මෛත්‍රී භාවනාව නමිනි.

26. "ඉමස්මිං සති ඉදං හොති - ඉමස්මිං අසති ඉදං න හොති." "මෙය ඇතිකල්හි මෙය වේ. මෙය නැතිකල්හි මෙය නො වේ." ආදී වශයෙන් අදාළ හේතු සාධක පවත්නා කල්හි ඵලයක් ඇතිවීම බුදු දහමේ විග්‍රහ වන්නේ,
    - (1) පටිච්චසමුප්පාදය තුළිනි.
    - (2) අහේතුවාදය තුළිනි.
    - (3) කර්මවාදය තුළිනි.
    - (4) හේතුවාදය තුළිනි.

27. ගුරුතුමිය ආර්ය අෂ්ටාංගික මාර්ගයේ එක් මාර්ග අංගයක් පැහැදිලි කරමින් සිටියා ය. සිසු පිරිස සත්ත්ව ඝාතනයෙන් වැළකීමටත්, අන්සතු වස්තුව ආරක්ෂා කිරීමටත්, සදාචාර සම්පන්න ජීවිතයක් ගත කිරීමටත් දැඩි සේ අධිෂ්ඨාන කර ගත්හ. ගුරුතුමිය විස්තර කළ මාර්ග අංගය,
    - (1) සම්මා දිට්ඨියයි.
    - (2) සම්මා සංකප්පයයි.
    - (3) සම්මා කම්මන්තයයි.
    - (4) සම්මා වායාමයයි.

28. දස රාජධර්මවලට අයත්, දැහැමි පාලකයකු සතුවිය යුතු ගුණධර්ම අතර සිය රටවැසියන් තම දරුවන් සේ සලකා ඔවුන්ට ක්‍රෝධ **නො කොට** කටයුතු කිරීම,
    - (1) අවිහිංසා නමින් හැඳින්වේ.
    - (2) අක්‍රෝධය නමින් හැඳින්වේ.
    - (3) අවිරෝධතා නමින් හැඳින්වේ.
    - (4) ඉවසීම නමින් හැඳින්වේ.

29. "මගේ රට, මගේ ජාතිය, මගේ ආගම, මගේ භාෂාව කියා වටිනා රත්න හතරක් මට තියෙනවා. ඒ රත්න හතර ආරක්ෂා කරගැනීම මගේ යුතුකමයි." මෙසේ ප්‍රකාශ කළේ,
    - (1) අනගාරික ධර්මපාලතුමා ය.
    - (2) සර් හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා ය.
    - (3) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි ය.
    - (4) වලිසිංහ හරිස්චන්ද්‍රතුමා ය.

30. බුද්ධ ධර්මය උගන්වන ගුරුතුමා වාර්ෂික චාරිකාවේ දී ශ්‍රී ලංකාවේ දැනට ශේෂව ඇති ඉපැරණි ම විහාර බිතුසිතුවම් නැරඹීම සඳහා ශිෂ්‍ය පිරිස රැගෙන ගියේ,
(1) සීගිරියේ පිදුරංගල විහාරයට ය. (2) පොළොන්නරුවේ තිවංක පිළිමගෙයට ය.
(3) ලංකාතිලක විහාරයට ය. (4) ගඩලාදෙණි විහාරයට ය.

31. සිංහල කාව්‍ය සාහිත්‍යයේ උපදේශ සැපයීම හා සදාචාර සංවර්ධනය උදෙසා ම ලියවුණු කාව්‍ය ග්‍රන්ථ **තුනක්** ලෙස හැඳින්විය හැක්කේ,
(1) සසදාවත, මුවදෙව්දාවත හා කව්සිළුමිණ ය.
(2) බුදුගුණාලංකාරය, කාව්‍යශේඛරය හා ලෝවැඩසඟරාව ය.
(3) ලෝවැඩසඟරාව, සුභාෂිතය හා ලෝකෝපකාරය ය.
(4) ලෝවැඩසඟරාව, බුදුගුණාලංකාරය හා ගුත්තිලය ය.

32. හිටි පිළිම, හිඳි පිළිම, සැතපෙන පිළිම යන තුන් ඉරියව්වෙන් ම වැඩ සිටින පිළිම දක්නට ලැබෙන්නේ,
(1) මාලිගාවිල ය. (2) තන්තිරිමලේ ය.
(3) පොළොන්නරුවේ තිවංක පිළිමගෙයි ය. (4) පොළොන්නරුවේ ගල්විහාරයේ ය.

33. ශ්‍රී ලංකාවේ ස්තූපවලට ආවේණික නිර්මාණයක් ලෙස සැලකෙන, ස්තූපයේ ආරක්ෂාව හා අලංකාරය සඳහා ගොඩනංවා ඇති, තොරණක් වැනි අලංකාර කැටයම් සහිත නිර්මාණය,
(1) වටදාගෙය නමින් හැඳින්වේ. (2) වාහල්කඩ නමින් හැඳින්වේ.
(3) කොරවක්ගල් නමින් හැඳින්වේ. (4) මුරගල් නමින් හැඳින්වේ.

34. 'බුදු පිළිමය' නමැති කලා නිර්මාණය පිළිබඳ නිරීක්ෂණයෙහි යෙදුණු සිසු පිරිසට පෙනීගියේ ආසන හෙවත් බුදුරජාණන් වහන්සේ වැඩසිටිනා ආකාරය වැදගත් අංගයක් බවයි. ඒ අනුව වම්පාදය දකුණු පාදය මත සිටින සේ වැඩ හිඳි පිළිමය ඔවුන් නිවැරදිව හඳුනා ගනු ලැබුවේ,
(1) පද්මාසන නමිනි. (2) වජ්‍රාසන නමිනි. (3) වීරාසන නමිනි. (4) භද්‍රාසන නමිනි.

35. අනුරාධපුර බිසෝමාලිගය අසල පිහිටි සඳකඩ පහණ, සිසුන් සමඟ සුපරීක්ෂාවෙන් නැරඹූ ගුරුතුමිය එහි 'සංකේතාර්ථයක් පවතියැ'යි විවිධ උගතුන් ප්‍රකාශ කර ඇති බව පැවසී ය. ඒ අතර මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතාගේ අදහස ලෙස ගුරුතුමිය පැවසුවේ එය,
(1) සංසාරයෙන් එතෙරවීම සංකේතවත් කරන බවයි.
(2) පාදෝවනය සඳහා පිහිට වූ ගල් පුවරුවක් බවයි.
(3) සතර දිශාවෙන් බැතිමතුන් පැමිණෙන බව සංකේතවත් කරන බවයි.
(4) මහා කරුණාව හා ප්‍රඥාව සංකේතවත් කරන බවයි.

36. දුටුගැමුණු මහරජතුමා කැනවූ ස්තූප **දෙක** වන්නේ,
(1) මිරිසවැටිය හා අභයගිරියයි. (2) අභයගිරිය හා ජේතවනයයි.
(3) මිරිසවැටිය හා රුවන්වැලිසෑයයි. (4) රුවන්වැලිසෑය හා ජේතවනයයි.

37. තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල ගණයට ඇතුළත් **නො වන** කරුණ වන්නේ,
(1) නවරට සසුන් පිහිටුවීමයි. (2) දුසිල් මහණුන් සසුනෙන් නෙරපීමයි.
(3) කථාවත්ථුප්පකරණය සම්පාදනය වීමයි. (4) දසවත්ථුව ප්‍රතික්ෂේප වීමයි.

38. ථෙරවාදී ත්‍රිපිටකය ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කොට ඉංග්‍රීසි අකුරින් මුද්‍රණය කිරීම සඳහා එංගලන්තයේ පාලි ග්‍රන්ථ සමාගම (Pali Text Society) ආරම්භ කරනු ලැබුවේ,
(1) රිස් ඩේවිඩ්ස් විසිනි. (2) එච්.ජී. වෙල්ස් විසිනි.
(3) විල්හෙල්ම් ගෛගර් විසිනි. (4) ගුණපාල මලලසේකර විසිනි.

39. බෞද්ධ රාජ්‍ය පාලනය පිළිබඳ උපදෙස් අන්තර්ගත සූත්‍ර දේශනාවක් ලෙස සැලකිය හැක්කේ,
(1) චක්කවත්ති සීහනාද සූත්‍රයයි. (2) සිගාලෝවාද සූත්‍රයයි.
(3) මහාමංගල සූත්‍රයයි. (4) පරාභව සූත්‍රයයි.

40. "සියලු මිනිස්සු මගේ දරුවෝ ය." යනුවෙන් පවසමින් බෞද්ධ රාජ්‍යපාලන ප්‍රතිපත්ති ආදර්ශයට ගත් ශ්‍රේෂ්ඨ ම රාජ්‍ය පාලකයා,
(1) අශෝක රජතුමායි. (2) කණිෂ්ක රජතුමායි.
(3) දුටුගැමුණු රජතුමායි. (4) මහා පරාක්‍රමබාහු රජතුමායි.

* *

[ පස්වැනි පිටුව බලන්න.